

# පහේ කඩ ඉම ජය ගමු

ප්‍රස්ථාව පිරුළු

රූඪී / ඉඟිවැකි

ආප්තෝපදේශ

නෙතුලි තිලකරත්න

# පහේ කඩ ඉම ජය ගමු

කතෘ :- නෙතුලි හිමංසා තිලකරත්න

කෘතිය පල කරන දිනය :- 2023/ 11 / 15

කතෘගේ වෙනත් කෘති :- කූඹි රැජින
මලීගේ උපකාරය
දඟකාර මීකී
කපුටු බඩගින්න
අපූරු මායාලන්තයේ චාරිකාව
The Queen Ant

# පිදුම

මගේම

ආ අප්පච්චිටත්,

ද අම්මාටත්,

ර මල්ලීටත්,

ණී සමන්මලී

ය ගුරුමැණියන්ටත්

පුද දෙමි

මෙම පොත

සදාදර සිතින් !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකිම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකිමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණ කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් **"දිවිය දිනන විද්‍යුත් පොතක්"** ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ **"දිවිය දිනන විද්‍යුත් පොතක්"** ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

# පහේ කඩ ඉම ජය ගමු

## ප්‍රස්ථාව පිරුළු

- ළිඳේ ඉන්න ගෙම්බා වගේ.
  - තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැතිව සිටිම.
- ඉඳිකටුවයි නූලයි වගේ.
  - සැම විට ම තමන් සමග තවත් අයෙක් එකට සිටීම
- මඩේ හිටවලු ඉන්න වගේ.
  - එක තීරණයක නොසිටිම.

- ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ.
    - කෙනෙකුගෙන් කෙසේවත් ලබා ගැනිමට නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම.

- පරං ගියා කෝට්ටේ ගියා වගේ.
    - කෙටි පාරක් තිබියදී දුර පාරකින් යෑම.

- කළුවා මාරපන ගියා වගේ.
    - විමසීමකින් තොර ව යමක් කිරීම.

- ආඩි හත් දෙනාගේ කැඳ හැලිය වගේ.
    - අනුන් රවටන්න ගොස් තමන් රැවටීම

- කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ
    - නුසුදුස්සාට තනතුරු/වරප්‍රසාද දීමෙන් අහංකාර වීම.

- ඉඟුරු දීලා මිරිස් ගත්තා වගේ
    - යම් අපහසුතාවයකින් හෝ කරදරයකින් හෝ මිදීමට කරන ක්‍රියාවෙන් වඩාත් කරදරයකට හා අපහසුතාවට පත් වීම.

- කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ
    - තීරණ ගැනීමේදී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම.

- ගඟට ඉනි කැපුවා වගේ
    - දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

- රයිගමයයි, ගම්පළයයි වගේ
    - ගැළපෙන අදහස් හා ගතිගුණ තිබීම.

- නරියා මිදි තිත්තයි කිව්වා වගේ.
    - යමක් කිරීමට උත්සාහ කර එය කර ගත නොහැකි විට එහි අගුණ කීම.

- කට නිසා ඉබ්බා නැහුණා වගේ
    - සුදුසු නුසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කතා කිරීම.

- මහදැනමුත්තාගේ නුවණ වගේ
    - අදූරදර්ශී උපදෙස් දීම.

# රැඩී / ඉඟිවැකි

- එක හුස්මට
  - යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම යි.
- අකුරක් නෑර
  - කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම යි.
- ඉහේ මලක් පිපුණා
  - දැඩි සතුටකට පත් වීම යි.
- අනූ නවයෙන් බේරුණා
  - යම් විපතකින් යාන්තමින් ගැලවීම යි

- මොර සූරන වැස්ස
  - අධික වර්ෂාව යි.
- ඇඟ බේරා ගන්නවා
  - වගකීමෙන් බේරීම
- හීන් දාඩිය දැම්මා
  - දැඩි සේ බියට පත් වීම.
- අහසේ මාළිගා තැනීම
  - ඉටු නොවන සිහින මැවීම
- අබමල් රේණුවක්
  - ඉතාම කුඩා ප්‍රමාණයක්
- මුරුංගා අත්තේ තියනවා
  - රවටනු පිණිස වර්ණනා කිරීම.

# ආප්තෝපදේශ

- අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න.
  - අද කළ යුතු දේ අදම කරන්න. හෙටට කල් නොදමන්න.

- ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න
  - ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න.

- පනින්න පෙර සිතා බලනු
  - යමක් කිරීමට පෙර සිතා බලන්න.

- ඇවිළෙන ගිනදරට පිදුරු නොදමන්න
  - ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න

- උගතමනා ශිල්පයමයි මතු රැකෙනා

උගත් ශිල්පයමය මතු ආරක්ෂාව සළකයි.

නෙතුලි හිමංසා තලකරත්න

✍



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනිම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට

**සෙනවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 . 11 . 01